# පහන් වැට



## නන්දා

උහුලන්න බැරි තරම්
දුක් ගැහැට දළුලද්දි
උණු කඳුළු වැහි පොදේ හංගා
හිතුවෙ නැති වෙලාවක
කොග්ගලත් නිල් අහස හැරුවා

බිඳුණු උළු කැට මැදින්
වෑස්සෙන වැහි බිංදු
තිස්සගේ පන් පැදුරෙ වැටිලා
වෙනද වාගෙම අදත්
නුඹෙ හිතේ බිඳුණු තැන්
හොඳටෝම තෙමනවද නන්දා ?

අතීතයෙ පිහි තුඩඬග
පපුව මැද ඇමිණෙද්දි
හෙණ හරෑක ගැඹුරින්ම රන්දා
මම නගපු විලාපය
හිරි ගලේ දෙවොලටත් ඇහුණා

අවසාන පණ කෙන්ද
වාට්ටුවෙ ඇඳ උඩදි
නික්මෙන්න පොර බඳපු හින්දා
පියවෙනා ඇස් අතර
නුඹෙ නමට පවරාපු
හීනයක් ඉතිරි වී තිබුණා

ජීවිතේ පුරාවට
මැරි මැරී ඉපදිලා
මටත් දැන් පුරුදු ඇති හින්දා
මගේ තුන් හිතකවත්
අමනාප නැති බවත්
පියල්ටත් කියාපන් නන්දා .

මහේෂ් මධුරංග

## අවසන් ගමන් ගිය පියතුමන්ට... දුරු රට සිටින දියණියගෙන්....

| | |
|---|---|
| දා බිඳු හෙලා දිරියෙන් දැඩි කල | දෝණී |
| තුරුලෙහි හොවා නෙතු මෙන් රැකගත් | දෝණී |
| හෙළ කුල සිරිත් ලෙද කුලගෙට දුන් | දෝණී |
| සව්සිරි සොයා නොරටක තනි වූ | දෝණී |
| සීතල හිම රටේ සිරියට සිත් | බන්දා |
| මා පිය සෙනෙහසත් ඈ උගසට | බැන්දා |
| තැබූ පය පෙරට ආපසු ගනු බැරි | හින්දා |
| සවසක් පුරාවට සැපසේ දුක් | වින්දා |
| නික්මුණ දින ඔබේ පාමුල හිස | රන්දා |
| ඉකිබිඳ හැඩුයුරු නෙතු කදුලැලි | බන්දා |
| ඔබ තනිකොට එන්ට මා පව්කළ | හින්දා |
| මනැසින් දහස් වර මැරි මැරි දුක් | වින්දා |
| ලෙඩවූ දිනේ දිවගොස් සුවදුක් | විමසා |
| ආ මුත් හනි හනික ඔය හදවත | සනසා |
| හැරගිය දිනේ අප සැම මනුදම් | නොලසා |
| ඔබ ළඟ රැඳෙනු බැරි විය පින් මඳ | විලසා |
| පිය සෙනෙහස තවම හිම් දූ පුතුනි | උතුම් |
| මොහොතක් සිතනු මැන ගොනුකොට හදෙහි | පැතුම් |
| පියවරු රැදෙනු නැත සැමදා විලස | සිතුම් |
| යුතුකම කරනු මැන පෙරටුව කුළුණු | පැතුම් |

නිරංජලා රාජපක්ෂ

## දිරිය මව ඔබය මගෙ අම්මේ..

දස දහසක් කම්කටොලු බාධක
මැදහත් සිතින් විඳ දරාගෙන
දරුවන් සිව් දෙනෙක් සිප් කිරි පොවා,
ඇති දැඩිකර, රටට වැඩැති
මිනිසුන් කල දයාබර අම්මේ.....

නින්දා - අපහාස - සුනාමි
පවුල් සංගමයේ හැල හැප්පිලි
මහා මෙරක් සේ විඳ දරාගෙන,
හැකි හැමවිටම දරු මුණුබුරන්ගේ
දුක සැප බලාගෙන
අපව රැක බලාගත් අම්මේ...

තම දරුවන්ගේ - නෑසියන්ගේ
සැපත නිතර පැතූ ඔබ
දුකේදී සැපේදී ඉන්ද්‍රඛීලයක් සේ
නොසැලී සිටිය ඔබ,
ලෙඩ ඇඳේ වැතිර දිවිය වෙනුවෙන්
පුරා දින ගණනක් සටන් වැදුන ඔබ
දිරිය මවකි මට ඔබ, මගේ අම්මේ......

අප දන්නා කාලයේ පටන්
නැති බැරි අයට උදව්වක් ඉල්ලූ අයට
තම හකි පමණින් උපකාර කල ඔබ,
මිල මුදලට - රන් අභරණ - ඉඩම කඩමට
මිනිසත් කම - සහෝදර කම
නැති කරගන්නා ගුණමකු ලෝකයාට
ජීවිතයේ අනියත බව - නොතිර බව
මොනවට පැහැදිලි කල ඔබ,
ජීවිතයේ අවසාන භාගයේ, දුරු රට තනිව
හුදෙකලාව, ගත කලත්, සිතින් ඔබ
නිතර දරුවන් ගැන සිතන්නට ඇති
අම්මේ....
සියළු දේ අනියත බව - අස්ථිර බව
මට පසක් කල දුන් ඔබ,
ඔබ නැතිදා සියළු දෙයින්,
සියළු දෙනාගෙන්
ඹට පලක් නැති බව
අවබෝධ කර දුන් ඔබ
මගේ දෙදරුවනටද මවගේ අගය
තේරුම් ගන්නට මඟපාදා දුන් ඔබ,
සංසාරේ කවදා හෝ දිනෙක,
නැවත එක්වී පාරමී පුරමි,
මෙතේ බුදුන් දැක නිවන් දකින්නට
මට වරම් දුන මැනවි,
මට පිහිට වනු මැනවි මගේ ආදර අම්මේ

තුසිතා අබේගුණවර්ධන
දකුණු ඕස්ට්‍රේලියාව

## තාත්තේ



දරාගෙන දස මසක්
කළල මා සිත තුළම
නුඹ වුණා ඇත් පවුර
මව් කුසට දිවිය දෙන

දැනුණු දා මුල් වරට
පිය පදවි ලැබූ බව
දනිම් නුඹ පැළඳි බව
රජ ඔටුනු නුඹ සිතින

මා හදන්නට මා වඩන්නට
ඉසිඹුවක් නොලබාම
වෙර දරා වෙහෙසෙන
නුඹය හිරු මව් සඳට
එකළු කරවන ලොවම එකවර

දනිම් සව් තිබෙන බව
තාත්තේ මම නුඹට
ලොවම ගෙනැවිත් තබා
මගේ කුඩා දෙපා මුල හිනැ-
හෙන්න
සඟවාන වෙහෙස ගඟ

හිරු නැගෙයි සඳු නැගෙයි
දනිම් ඔබ අවදියෙන්
සෙනෙහසින් මා වෙතම
ඇසිපිය නොසෙල්වගෙන

නුඹය කැණි මඬල නිවසේ
වැඩ හිඳින මගෙ හද මඬලේ
මැණියන් සමග මතු බවයේ
ලබන බුදු බව නිතියේ

*(සොයුරු ශ්‍රීනාත් සොයුරිය ශ්‍රීයාණී ඔබ දෙපලට සෙනෙහසින්)*

හේමමාලි
බණ්ඩාරනායක

## මොනාලිසා



උපුල් නුවන් විදහා
ඔබ සිනාසුනා
ඹම සිනාසුනා
ඈ මොනාලිසා

අඩක් වැසුනු නිල් මිණි වන් දෙනෙත්
තොල් දෙකේ සෙලවුම
මදහස සිනාව ගැහෙන හදවත
ලංවූ ඇගේ නැහැයෙන්
මගේ මුහුණට වැටෙන
සුවඳින් මත් වූ මා
ඈ සිපගන්නට ලංවෙත්ම
ඈ ඉවත ගියා

සිසිල් සඳ රැස් නිමාවී
මහ ගන කළු වලාවක්
සෙමින් නැගී මුදුන් විය.

දුර ඇතින් පෙනෙන
හද විදයන ඇගේ මදහස සිනාව
විනා අන් දෙයක් මා නුදුටිමි

පෙදෙසා වටා පැතිරිණු නිහඬින්
කාන්සියට පත්වූ මම
ඇගේ දිගටි මහුණ පුළුල් නෙත් යුවල
තවමත් කාන්තිය පතුරුවමින්
මිනිසා වශීකළ හැකි
මද සිනහව බලා
මම නිසංසලව කරබා ගතිමි.

මෙය සිහිනයක්ද ? නැහැ
ඇත්තක්ද ? මම නොදනිමි.

හැබැයි, තුරුල් කර වැළඳගන්නට
සිපගන්නට
හෙට, අනිද්දා ඉන් අනිද්දා එනවා
ආදරියේ ඔබ කරා
නැවත වරක්.

ආචාර්ය
මාතු ලියනගේ

## සැමරුම

හමා ගිය මාරුතේ
තුනියට ගැවසී ගත්
සපුමල් සුවඳ නුඹ ....

පළා ගිය පුන්සඳේ
පෙනී නොපෙනී තිබූ
චන්ද්‍ර ලපය නුඹ.....

තනිවුනු මහිතේ
කොනක දැවටුණු
වසත් මල් පෙත්ත නුඹ......

මධු වර්ණකුලසූරිය

## නව වසරේදී

සිතන සිතුමන්
පතන පැතුමන්
එකක් නෑරම
සඵල වේවා

වාසනා මල්
දොරටු මැද්දෙන්
ජීවිතේ
දියුණුවට යේවා

මාලා
කරුණාතිලක

## ඔහු



*ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය මූලාරම්භක ජී.කේ. හත්තොටුවේගම ගුරු පියාණෝ අභාවප්‍රාප්ත වී වසර දෙකක් පිරීම නිමිත්තෙනි*

කොබෙයි රැලක් රංචු ගසා නගින්නේ ...//
නිල් අහස හඹා යන පිළිහුඩුවා ...//
වනයේ ගිරවා...... තොල රතු කෙරුවා ...//
කොබයි රැලක්.....

ගෙවනු නවසිය හැට ගනන්වල
විදුලිකර දළුගම මණ්ඩපයේ
මැදියම් රැයෙහි ඒ ගැඹුරු ගී රාවය
විද්‍යා මණ්ඩප ගොඩනැගිලි සිකරයෙන් නිකුත්ව
මන්ද මාරුතයට මුසුව
සරසවි කඳු මුදුන සිසාරමින්
ගිනි පුලිඟු නංවන
තෙල් පිරිපහදු දුම් සිකරය වෙත
ඇද යයි......

ඔබ අද මෙහි නැතත්
ඔබගේ මනෝ කාය
මෙම බිම පුරා සැරිසරනු ඇත
ගී ගයනු ඇත
නාටක රඟ දක්වනු ඇත

ඔබ නොමැති සරසවියෙ
අඩුව පුරවනු පිණිස
පුන් පෝ දිනක
එනු මැන
මැදියම් රැයක සඳ පිරුණු
ගෝල බාලයෝ රැස්ව
ඔබ හට
මල් කලඹක්
පුදනු ඇත.

සුනිල් අබේසේකර
ආදි විද්‍යාර්ථී - කැලණිය වි.වි. (1965 - 1970)

## LIFE...A SEAMLESS DREAM.

Within us, the vast expanses lie,
With ice-berg deceptivity,
Till, in sleep,the sub-conscious stirs
With eruptive violence,
Spewing forth harsh tongues
Of truss-freed impulses,
Tracing febrile dances,
Fascinating and horrible,
In the primal mind –sludge,
Engulfing and carrying,
In a suffocating avalanche
That crushes, but spares
The life –spark,
To live the pain,
Even in the dream.
A new dawn breaks, bringing with it
The all pervading breath of the Eternal,
As the unbridled senses,
Slip- in to an ocean of vast stillness;
Irresolution grips you in slow undeath,
As the dragonfly's whirring wing beat,
Violates, the Lotus Flower's First Silence.

**Chandra Wickramasinghe.**
Colombo 06.